Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2018

**8 ශ්‍රේණිය** **පුරවැසි අධ්‍යාපනය**

**නම :** ..........................................................................................................................

- **අංක 01 සිට 20 දක්වා දී ඇති පිළිතුරු අතරින් වඩාත්ම සුදුසු පිළිතුර යටින් ඉරක් අඳින්න.**

**I කොටස**

1) පොදු සේවාවල විකාශනය අනුරාධපුර රාජධානි සමය දක්වා විහිදෙන අතර අනුරාධපුර යුගයේදී ගම් දහසකට එක් වෛද්‍යවරයෙකු බැගින් පත්කළ රජතුමා වන්නේ,

1. පඬුවස්දෙව් රජතුමා 2. බුද්ධදාස රජතුමා
3. විජය රජතුමා 4. පණ්ඩුකාභය රජතුමා

2) නිදහස් අධ්‍යාපනය ශ්‍රී ලංකාවට හඳුන්වා දීමේ ගෞරවය හිමිවන්නේ,

1. එස්.ඩබ්.ආර්.ඩී.බණ්ඩාරනායක මැතිතුමා 2. සී.ඩබ්.ඩබ්. කන්නන්ගර මැතිතුමා
3. සිද්දි ලෙබ්බේ මැතිතුමා 4. පොන්නම්බලම් රාමනාදන් මැතිතුමා

3) සමුපකාරයේ ආදර්ශ පාඨය වන්නේ,

1. ධම්මෝ හවේ රක්ඛති ධම්මචාරී 2. එකා සැමටත් සැම එකාටත්
3. විද්‍යා දදාති විනයං 4. අත්ත දීපා විහරථ

4) මව, පියා හා දරුවන් පමණක් සිටින පවුල හඳුන්වන්නේ,

1. විස්තෘත පවුල නමිනි. 2. න්‍යෂ්ටික පවුල නමිනි.
3. මහ පවුල නමිනි. 4. බද්ධ පවුල නමිනි.

5) සමාජයේ දැකිය හැකි කුඩාම, මුලිකම හා වැදගත්ම ඒකක වන්නේ.

1. පාසල 2. දහම් පාසල 3. ගම 4. පවුල

6) පාසල තුළ දක්නට ලැබෙන ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණයක් වන්නේ,

1. සහයෝගයෙන් කටයුතු නොකිරීම. 2. සාකච්ඡා මඟින් නිවැරදි තීරණ නොගැනීම.
3. නායකත්වයට ගරු කිරීම. 4. පාසලේ පොදු නීතී රීති පිළිනොගැනීම.

7) එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියට අනුව ළමයින් ලෙස සැලකෙන්නේ,

1. වයස අවුරුදු 18 සම්පූර්ණ නොකළ පුද්ගලයින් 2. වයස අවුරුදු 21 සම්පූර්ණ නොකළ පුද්ගලයින්
3. වයස අවුරුදු 19 සම්පූර්ණ නොකළ පුද්ගලයින් 4. වයස අවුරුදු 20 සම්පූර්ණ නොකළ පුද්ගලයින්

8) ළමා අයිතිවාසිකම් සුරැකීමට ක්‍රියාත්මක වන ජාත්‍යන්තර ආයතනයක් වන්නේ,

1. Unicef 2. Unisco 3.WHO 4. Opec

9) ප්‍රජාතන්ත්‍රවාදී නායකයෙකු සතු විය යුතු ගුණාංගයකි.

1. සමාජශීලි නොවීම. 2. වංක කම 3. සවන් නොදීම 4. මානව හිතවාදී බව

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

10) ඒකාධිපති නායකත්ව ශෛලියට අයත් වේ.

1. පොදු දේපල අයුතු ලෙස පරිහරණය
2. වංචා හා දූෂණ කටයුතු වල නියැලීම.
3. ඉතා දැඩිව ක්‍රියාකිරීම.
4. පෞද්ගලිකත්වයට වැඩි නැඹුරුවක් දැක්වීම.

11) ඕනෑම සමාජයක් මෙහෙයවන ප්‍රධාන බලවේගය වන්නේ,

1. ආගම 2. භාෂාව 3. කුලය 4. සංස්කෘතිය

12) 'සමාජයේ සාමාජිකයෙකු වශයෙන් මිනිසා විසින් අයත් කරගන්නාවූත්, ලබා ගන්නාවූත්, දැනුම, විශ්වාස, කලා , සදාචාර දහම් හා වෙනත් හැකියාවන්ගේ සමස්තය සංස්කෘතිය වේ.' යන්න කාගේ නිර්වචනයක්ද?

1. ඊ.බී. ටයිලර් 2. මහාචාර්ය විමල් දිසානායක 3. ඇරිස්ටෝටල් 4. මහාචාර්ය ගානර්

13) ශ්‍රී ලංකාවේ අනිවාර්ය අධ්‍යාපනය ලැබීමේ වයස වන්නේ,

1. වයස අවුරුදු 10 දක්වා
2. වයස අවුරුදු 12 වක්වා
3. වයස අවුරුදු 14 දක්වා
4. වයස අවුරුදු 16 දක්වා

14) රටක් සතු වටිනාම සම්පත වන්නේ,

1. ජල සම්පත 2. වන සම්පත 3. මානව සම්පත 4. මහාමාර්ග

15) අප විසින් නොකළ යුතු දේ හඳුන්වන්නේ,

1. විරිත් ලෙසය. 2. ආගම ලෙසය. 3. සිරිත් ලෙසය. 4. සංස්කෘතිය ලෙසය.

16) බෞද්ධයන් හට ඉතා වැදගත් ආගමික උත්සවයකි.

1. නත්තල් උත්සවය 2. පාස්කු උත්සවය 3. දීපවාලී උත්සවය 4. වෙසක් උත්සවය

17) පන්ති නායකයාගේ අනුගාමිකයන් වන්නේ,

1. විදුහල්පති 2. ගුරු මණ්ඩලය 3. පන්තියේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් 4. ශිෂ්‍ය නායකයන්

18) බහු සංස්කෘතික සමාජ පවතින රටක් නොවන්නේ,

1. ඉරාකය 2. ඉන්දියාව 3. ශ්‍රී ලංකාව 4. ඇමරිකා එක්සත් ජනපදය

19) මුස්ලිම් ජනතාවගේ ශුද්ධ භූමිය ලෙස සැලකෙන්නේ,

1. කැලිෆෝනියා 2. මක්කම 3. අයොවා 4. මිචිගන්

20) ළමා අයිතිවාසිකම් ආරක්ෂා කර දීමට ක්‍රියාත්මක වන ආයතනයකි.

1. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
2. සෞඛ්‍ය අමාත්‍යාංශය
3. ජාතික ළමා ආරක්ෂක අධිකාරිය
4. මධ්‍යම පරිසර අධිකාරිය

(ල. 20 x 2 - 40)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

## II කොටස

**පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**

**පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු ලියන්න.**

1) i) පොදු සේවා 3 ක් නම් කරන්න. (ල. 03)

ii) පොදු සේවා වල පොදු ලක්ෂණ 2 ක් ලියන්න. (ල. 02)

iii) ආයුර්වේද වෛද්‍ය ක්‍රමය යටතේ පවත්වාගෙන යන ආයතන 2 ක් නම් කරන්න. (ල. 02)

iv) අධ්‍යාපනය ලැබීමට ඇති අයිතිය සුරක්ෂිත කිරීම සඳහා රජය ගෙන ඇති පියවර 2 ක් සදහන් කරන්න. (ල. 02)

v) පවුල තුළ දක්නට ලැබෙන ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ 3 ක් සඳහන් කරන්න. (ල. 03)

vi) ළමා අයිතිවාසිකම් බෙදා දක්වන තේමා 4 ලියන්න. (ල. 04)

2) i) පොදු සේවා යන්න නිර්වචනය කරන්න. (ල. 02)

ii) අප ප්‍රයෝජනයට ගන්නා පොදු සේවා 4 ක් නම් කරන්න. (ල. 04)

iii) පොදු සේවා මහජනතාව වෙත සපයන ආකාරය අනුව වර්ග කළ හැකි ක්‍රම 3 දක්වා ඉන් එකක් විස්තර කරන්න.

3) i) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කර ඇති විශේෂ සේවාවන් 2 ක් නම් කරන්න. (ල. 02)

ii) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් බස් ඩිපෝවක සේවා සැපයීමට දායක වන කාර්ය මණ්ඩලයේ සේවකයින් හතර දෙනෙකුගේ තනතුරු නම් කරන්න. (ල. 04)

iii) පොදු ප්‍රවාහන සේවා කාර්යක්ෂම කිරීම සඳහා රජය විසින් ගෙන ඇති පියවර 3 ක් සඳහන් කර ඉන් එකක් විස්තර කරන්න.

4) i) පවුලේ ස්වභාවය අනුව වර්ග කළ හැකි පවුල් වර්ග 2 ලියන්න. (ල. 02)

ii) පාසල තුළ දක්නට ලැබෙන ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ 4 ක් ලියන්න. (ල. 04)

iii) ප්‍රජාතන්ත්‍රවාදී ජීවන ක්‍රමයක් හුරු කිරීම සඳහා පාසල ක්‍රියාත්මක කරන විෂය සමගාමී ක්‍රියාකාරකම් 5 ක් ලියන්න. (ල. 05)

5) i) නායකත්වය යනු කුමක්ද? (ල. 02)

ii) නායකයකු සතුවිය යුතු ගුණාංග 4 ක් ලියන්න. (ල. 04)

iii) සමාජය තුළ දැකිය හැකි නායකත්ව හෛලීන් 3 ක් ලියා ඉන් එකක් විස්තර කරන්න. (ල. 05)

6) i) බහු සංස්කෘතික සමාජ පවතින රටවල් 2 ක් නම් කරන්න. (ල. 02)

ii) බහු සංස්කෘතික ජන සමාජයක ලක්ෂණ 4 ක් ලියන්න. (ල. 04)

iii) බහු සංස්කෘතික රටක් ලෙස ශ්‍රී ලංකාවේ පවතින ආගම් 3 ක් දක්වා ඉන් එක් ආගමක් හ බැඳුණු සිරිත් විරිත් හා සම්ප්‍රදායන් විස්තර කරන්න. (ල. 05)

7) i) වර්තමානයේ මුහුණපෑමට සිදුවී ඇති අනතුරු හා විපත් විවිධාකාරය. ඒවායේ ස්වභාවය අනුව බෙදිය හැකි ප්‍රධාන කොටස් 2 ලියන්න. (ල. 02)

ii) මිනිස් ක්‍රියාකාරකම් නිසා ඇතිවන විපත් 4 ක් ලියන්න. (ල. 04)

iii) ස්වභාවික විපත් අවම කරගැනීම සඳහා ගතහැකි ක්‍රියාමාර්ග 3 ක් දක්වා ඉන් එකක් විස්තර කරන්න. (ල. 05)